6 ව්‍යාපාර දිරිගැන්වීම සඳහා පවත්නා උපකාර

හැඳින්වීම



ලොව සෑම රටක ම කුඩා පරිමාණයේ ව්‍යාපාර පවතී. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයෙහිලා කුඩා ව්‍යාපාරවල දායකත්වය ඉතා වැදගත් ය. රැකියා සැපයීම, රටේ නිෂ්පාදනයට හවුල් වීම, දේශීය සම්පත් ප්‍රයෝජනයට ගැනීම, පුද්ගලයනට ආදායම් ඉපැයීමට අවස්ථාව ඇති කර දීම, මහා පරිමාණ ව්‍යාපාරවල පැවැත්මට ඉවහල් වීම යන ආදි වශයෙන් ආර්ථික සංවර්ධනයෙහි ලා කුඩා ව්‍යාපාර දායක වේ. මේ නිසා කුඩා ව්‍යාපාර දිරිගැන්වීම කෙරෙහි රජය ද පෞද්ගලික අංශය ද විශේෂ අවධානය යොමු කර ඇත. එහෙයින් කුඩා පරිමාණ ව්‍යාපාරවලට උපකාර කිරීම සඳහා රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශයේ ආයතන ද ගණනාවක් කටයුතු කරයි.

වෙනස් වන පරිසරය තුළ ව්‍යාපාර අවස්ථා නිතර ම බිහි වේ. එලෙස බිහි වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට ව්‍යවසායකයෝ යොමු වෙති. ව්‍යවසායකයන් ආරම්භ කරන ව්‍යාපාරවල කටයුතු සාර්ථක ව කර ගෙන යාම සඳහා විවිධාකාර සහාය අවශ්‍ය කැරේ. මේ සහාය මූල්‍ය හා මූල්‍ය නොවන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය. මූල්‍ය සේවාත් මූල්‍ය නොවන සේවාත් සපයන ආයතන රාශියක් ශ්‍රී ලංකාව තුළ පවතී. කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ යන ව්‍යාපාර සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර හා උපකාර සැපයීමට විවිධ වැඩ සටහන් අරඹා ඇත. ව්‍යවසායකයන් ආරම්භ කරන ව්‍යාපාර ශක්තිමත් ව පවත්වා ගනිමින් ඒවායේ කටයුතු සාර්ථක ව කර ගෙන යාම සඳහා මේ දිරිගැන්වීම් ඉවහල් වේ. ව්‍යාපාර කටයුතු සඳහා මෙලෙස උදව් හා උපකාර සලසන ආයතන රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේත් ක්‍රියාත්මක වේ. එකී ආයතනවලින් සමහරක් සිය සේවා සැපයීම සඳහා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. සමහරක් පළාත්, දිස්ත්‍රික්ක යන ආදි වශයෙන් යම් බල ප්‍රදේශයකට පමණක් සීමා වී සේවා සපයයි. ඒ අතර ඇතැම් ආයතන මෙකී සේවා සපයන්නේ රැකියා විරහිත තරුණ තරුණියන්, ගොවීන්, ධීවරයන් යන ආදි තෝරා ගත් කණ්ඩායම් ඉලක්ක කර ගෙන ය. මේ පරිච්ඡේදයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා ගත හැකි උපකාර ද ඒ උපකාර සලසන ආයතන ද උපකාර ලබා ගැනීමේ දී ව්‍යාපාරිකයනට අනුගමනය කිරීමට සිදු වන ක්‍රියා පිළිවෙත් ද පිළිබඳ අවබෝධයක් ලබා දීම සිදු කැරේ.

ව්‍යාපාර දිරිගැන්වීමට ඉවහල් වන උපකාරක වැඩසටහන්

තරගකාරී පරිසරයක් තුළ ව්‍යාපාර සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා ව්‍යවසායකයන් දක්ෂ හා කාර්යක්ෂම විය යුතු ය. පරිසරයෙහි සිදු වන වෙනස් වීම් නිසා සාර්ථක ව්‍යාපාර වුව ද බිඳ වැටීමට පුළුවන. කුඩා පරිමාණ ව්‍යාපාරිකයනට තරගකාරී පරිසරය තුළ ව්‍යාපාර සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා විශේෂයෙන් දිරිගැන්වීම් ලබා දිය යුතු ය.

ව්‍යාපාර ආරම්භ කිරීම හා පවත්වා ගෙන යාම පිණිස ව්‍යාපාරිකයන් පෙළඹවීම සඳහා දෙන උපකාර **දිරිගැන්වීම්** ලෙස සැලකේ.

මේ දිරිගැන්වීම්වලට **මූල්‍ය සේවාත් මූල්‍ය නොවන සේවාත්** ඇතුළත් වේ. මෙකී දිරිගැන්වීම්වලට **ව්‍යාපාරයේ ප්‍රමාණය** හෙවත් පරිමාණය හා සම්බන්ධතාවක් පවතී. ව්‍යාපාරය සඳහා ආයෝජනය කර ඇති මුදල ව්‍යාපාරයේ නිරත සේවක සංඛ්‍යාව, වාර්ෂික පිරිවැටුම, නිෂ්පාදන ධාරිතාව යන ආදි සාධක එකක් හෝ වැඩි ගණනක් හෝ පදනම් කර ගෙන ව්‍යාපාරයේ ප්‍රමාණය නිර්ණය කැරේ. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ මහා පරිමාණ ව්‍යාපාර හැර සෙසු ව්‍යාපාර පහත සඳහන් අයුරු වර්ග කැරේ:

කුඩා හෙවත් සුළු පරිමාණ ව්‍යාපාර
මධ්‍ය පරිමාණ ව්‍යාපාර

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

කුඩා ව්‍යාපාර ලොව සැම රටක ම පැවතුණත් ඒවා නිශ්චිත ව හඳුන්වා දීම දුෂ්කර ය. එයට හේතුව වන්නේ ලෝකයේ විවිධ රටවල් කුඩා ව්‍යාපාර විවිධ අයුරින් හඳුන්වා දී තිබීම යි. රටවල් තුළ වුව ද කුඩා ව්‍යාපාර විවිධ ලෙස නිර්වචනය කර ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට උපකාර සපයන ආයතන ඒවායේ ප්‍රමාණය විවිධ ලෙස අර්ථ දක්වා ඇත. කෙසේ වෙතත් මහා පරිමාණ ව්‍යාපාරවලට සාපේක්ෂ ව කුඩා ව්‍යාපාරවල ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය, රැකියාවල නියුතු සේවක සංඛ්‍යාව, නිෂ්පාදන ප්‍රමාණය, වාර්ෂික පිරිවැටුම, වෙළෙඳ පොළට කළ හැකි බලපෑම යන ආදිය ඉතා අඩු ය. මේ හැර ශ්‍රී ලංකාවේ **ක්ෂුද්‍ර ව්‍යාපාර** වර්ගයක් ද වේ. ඉතා කුඩා පරිමාණයෙන් ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර ව්‍යාපාරවල විශේෂයෙන් දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් වේ. අයිතිකරු ව්‍යාපාරයේ කටයුතු සියල්ල ම පාහේ සිදු කිරීම, ව්‍යාපාරය ස්වයං රැකියාවක් ලෙස පවත්වා ගෙන යාම, ව්‍යාපාර කටයුතුවලට පවුලේ සාමාජිකයන් ද සහාය කර ගැනීම යන ආදිය එකී ව්‍යාපාරවල ලක්ෂණ වේ. ගෘහස්ථ නිෂ්පාදනයත් පුද්ගල සේවා සැපයීමත් මල්, එළවුළු, පලතුරු යන ආදි වගා කටයුතුත් සිල්ලර වෙළෙඳාමත් සත්ත්ව පාලනයත් විදුලි හා විද්‍යුත් උපකරණ අලුත්වැඩියාවත් ක්ෂුද්‍ර පරිමාණයෙන් බහුල වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපාර අවස්ථාවලට නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

ව්‍යාපාර දිරිගැන්වීම

ව්‍යාපාර ආරම්භ කිරීමටත් පවත්වා ගෙන යාමටත් ව්‍යාපාරිකයනට ලබා දෙන දිරි ගැන්වීම් මූල්‍ය හා මූල්‍ය නොවන වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකි ය.



ව්‍යාපාර කටයුතු සඳහා මුදලින් ලබා දෙන ආධාර මූල්‍ය දිරිගැන්වීම් වශයෙන් හැඳින්වේ. තාක්ෂණික, උපදේශන, අලෙවිකරණ, යටිතල පහසුකම් යන ආදි වශයෙන් ලබා දෙන ආධාර, මූල්‍ය නොවන දිරිගැන්වීම්වලට ඇතුළත් වේ.

මේ මූල්‍ය හා මූල්‍ය නොවන උපකාර ලබා දීම සඳහා රජයේ ආයතන ද පෞද්ගලික ආයතන ද කටයුතු කරයි. මූල්‍ය උපකාර පිළිබඳ ව මුලින් සලකා බලමු.

මූල්‍ය උපකාර

ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මෙන් ම එකී ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා ද ව්‍යවසායකයනට මුදල් අවශ්‍ය වේ. ව්‍යාපාර කටයුතුවලට අවශ්‍ය මුදල් බාහිරින් සපයා ගැනීමට බොහෝ අවස්ථාවල දී සිදු වේ. බැංකුවලින් ණය ගැනීම මෙහි දී කළ හැකි ය.

කුඩා, මධ්‍ය යන පරිමාණවල ව්‍යාපාර දිරිගැන්වීම සඳහා විශේෂ මූල්‍ය ආධාර ක්‍රම පවතී. මේ මූල්‍ය ආධාර ක්‍රමවලින් මූල්‍ය පහසුකම් සැපයෙන්නේ සහනදායි ආකාරයකට ය. සහනදායි යන්නෙන් අදහස් කැරෙන්නේ අය කරන පොළී අනුපාතික අඩු වීම, ණය ආපසු ගෙවීමට ඇති කාල සීමාව වැඩි වීම, ඇප සුරැකුම් ලිහිල් වීම යන ආදිය යි.

ව්‍යාපාර ආරම්භ කිරීමේ දීත් පවත්වා ගෙන යාමේ දීත් ඉඩම්, යන්ත්‍රෝපකරණ, බඩු තොග යන ආදි ය මිල දී ගැනීම, භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීම, විදුලිය, දුරකථන, ජලය ලබා ගැනීම, මාර්ග ඉදි කිරීම හා සංවර්ධනය කිරීම, භාණ්ඩ සැකසීම සහ ඇසුරුම් කිරීම, නව තාක්ෂණය ලබා ගැනීම, ව්‍යාපාරය නවීකරණය කිරීම යන ආදි කටයුතු සඳහා මූල්‍ය ආධාර ලබා ගැනීමට ව්‍යවසායකයනට පුළුවන. කුඩා පරිමාණයේත් මධ්‍ය පරිමාණයේත් ව්‍යාපාර සඳහා ව්‍යවසායකයනට මූල්‍ය ආධාර ලබා දෙන ණය යෝජනා ක්‍රම

6.1 රූප සටහන

රාශියක් ක්‍රියාත්මක වේ. ඇතැම් ණය යෝජනා ක්‍රම ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. සෙසු ඒවා යම් යම් බල ප්‍රදේශවලට හෝ ඉලක්ක කණ්ඩායම්වලට හෝ සීමා වී පවතී. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය , කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ණය ව්‍යාපෘතිය (සුමදි), සුළු පරිමාණ ව්‍යවසාය නංවා ලීමේ ණය යෝජනා ක්‍රමය (සුවන), සුළු ගොවීන් හා ඉඩම් නැති වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය, දිළිඳුකම පිටු දැකීම සඳහා වන කෙටි හා මධ්‍ය කාලීන සුළු පරිමාණ ණය ව්‍යාපෘති යන මේවා මෙකී ණය යෝජනා ක්‍රමවලට නිදසුන් වේ. මේ ණය යෝජනා ක්‍රමවලට වඩා සුවිශේෂත්වයක් දක්වන ණය යෝජනා ක්‍රමයක් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය දැක්විය හැකි ය.

ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයේ සුවිශේෂත්වය වන්නේ වඩාත් ලිහිල් කොන්දේසි හා සුරැකුම් මත මූල්‍ය ආධාර ඉතා කුඩා ව්‍යාපාරවලට ලබා දීම ය.

ස්වයං රැකියා ලෙස ව්‍යාපාර ආරම්භ කිරීමට පුද්ගලයන් පෙළඹවීමත් ඉතා කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම දිරිගැන්වීමත් මේ ණය යෝජනා ක්‍රමයේ මූලික පරමාර්ථ වේ. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පවුලේ සාමාජිකයකු ඇතුළු පුද්ගලයන් දෙ දෙනකුගේ ඇප සුරැකුම් මත ණය ලබා ගත හැකි ය. ඒ හැරුණු විට අය කරන පොළියත් ණය වාරික ආපසු ගෙවීමත් සම්බන්ධයෙන් පවත්නේ ද ලිහිල් කොන්දේසි ය.

මූල්‍ය නොවන උපකාර

ව්‍යාපාර ආරම්භ කිරීමටත් පවත්වා ගෙන යාමටත් මුදල්වලට අමතර ව මූල්‍ය නොවන සේවා ද අවශ්‍ය වේ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිමත් කිරීම සඳහා විවිධ ආයතන මූල්‍ය නොවන සේවා ද සපයනු ලැබේ.

තාක්ෂණික, උපදේශන, අලෙවි, යටිතල යන ආදි පහසුකම් මූල්‍ය නොවන සේවාවලට ඇතුළත් වේ.

6.2 රූප සටහන

මේ යටතේ ව්‍යාපාරිකයනට ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම, සේවකයන් පුහුණු කිරීම, නව තාක්ෂණ දැනුම ලබා දීම, අලෙවිකරණ පර්යේෂණ පැවැත්වීම, යටිතල පහසුකම් සැපයීම, වෙළෙඳ පොළ තොරතුරු සැපයීම, ව්‍යාපාර ලියා පදිංචි කිරීම, ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කර දීම, නීතිඋපදෙස් ලබා ගැනීම යන ආදි සේවා ඇතුළත් වේ.

ව්‍යාපාර ක්‍රියාත්මක වන අදියර හා ලබා ගත හැකි උපකාර

ව්‍යාපාර දිරිගැන්වීම සඳහා ලබා දෙන ආධාරවලටත් උපකාරවලටත් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක වන අදියර සමඟ සම්බන්ධතාවක් පවතී.

ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර, ආරම්භ කරන අවස්ථාවේ, ආරම්භ කිරීමෙන් පසු යනුවෙන් ව්‍යාපාරයක අදියර තුනක් මූලික වශයෙන් හඳුනා ගත හැකි ය.

එක් එක් අදියරේ දී ඇති වන අවශ්‍යතා විවිධ වේ. ව්‍යාපාර ලියා පදිංචි කිරීම, බලපත්‍ර ලබා ගැනීම, ඉදි කිරීම් හා සංවර්ධන කටයුතු යන මේවා ව්‍යාපාර ආරම්භ කිරීමට පෙර ඇති අවශ්‍යතා සඳහා නිදසුන් වේ. නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා සැලකිය යුතු මූල ධනයක් ආයෝජනය කිරීමට සිදු වේ.
ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී ද ව්‍යාපාරිකයනට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඇති වේ. මේ නිසා ව්‍යවසායකයන් ස්වකීය ව්‍යාපාර සඳහා අවශ්‍ය මූල්‍ය හෝ මූල්‍ය නොවන හෝ උපකාර ලබා ගැනීමට ක්‍රියා කිරීමේ දී ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක වන අදියර ගැන සැලකිලිමත් වීම වැදගත් වේ.

ක්‍රියාකාරකම 01

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබ අපේක්ෂා කරන්නේ යැයි සිතන්න

(1) ඒ සඳහා ඔබට විවෘත ව ඇති ව්‍යාපාර අවස්ථා හඳුන්වන්න
(2) ඒ එක් එක් ව්‍යාපාරයේ පරිමාණය කුමක් ද? පරිමාණය එලෙස අර්ථ දැක්වීම සඳහා පදනම් කරගත් සාධක මොනවාද?
(3) අපේක්ෂිත ව්‍යාපාරය සඳහා අවශ්‍ය විය හැකි උපකාර පහත දැක්වෙන සේවා යටතේ සටහන් කරන්න:
 මූල්‍ය සේවා
 මූල්‍ය නොවන සේවා.
(4) ඉහත සඳහන් සේවා ලබා ගත හැකි යැයි ඔබ අදහස් කරන ආයතන නම් කරන්න.

ක්‍රියාකාරකම 02

ඔබ හොඳින් දන්නා, ස්වයං රැකියාවක් ලෙස කරගෙන යන ව්‍යාපාරයක් තෝරා ගන්න.

(i) ඒ ව්‍යාපාරය හඳුන්වන්න.
(ii) ඒ ව්‍යාපාරයේ අයිතිකරුත් ව්‍යාපාර කටයුතුත් අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(iii) ඒ ව්‍යාපාරය පිහිටුවා ඇති ස්ථානය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකි තොරතුරු මොනවා ද?
(iv) එකී ව්‍යාපාරයේ ගනුදෙනුකරුවෝ වන්නෝ කවරහු ද?
(v) ඒ ව්‍යාපාරය තව දුරටත් ව්‍යාප්ත කිරීමට ඉඩ ප්‍රස්තා ඇතැයි ඔබ සිතන්නෙහි නම් ඒ පිළිබඳ විස්තර සපයන්න.

උපකාර ලබා ගැනීම

කුඩා පරිමාණ හෝ මධ්‍ය පරිමාණ හෝ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා සැපයෙන මූල්‍ය හෝ මූල්‍ය නොවන හෝ උපකාර ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේදයක් හඳුනා ගැනීම වැදගත් වේ. ව්‍යවසායකයාගේ ව්‍යාපාරික අවශ්‍යතාව අනුව මූල්‍ය හෝ මූල්‍ය නොවන හෝ සේවා සපයන ආයතන පිළිබඳ තොරතුරු සොයා ගැනීම ප්‍රයෝජනවත් වේ. එයට පසු ඒ ඒ සේවා සපයන ආයතනවල හමුවිය යුතු පුද්ගලයන් ද සේවා සලසා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ද දැන ගැනීම වැදගත් වේ. මෙලෙස ක්‍රියාත්මක වීමෙන් ව්‍යාපාරිකයනට අවශ්‍ය මූල්‍ය හෝ මූල්‍ය නොවන හෝ සේවා සලසා ගැනීම පහසු වේ.

ප්‍රථමයෙන් ආයතන පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රයෝජනවත් වේ. රාජ්‍ය අංශයේ ආයතන පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ දී රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය වෙත අවධානය යොමු කිරීම වඩාත් පහසු මාර්ගයක් වේ. එහි දී අවශ්‍ය නම් දුරකථන අංක 1919 අමතා තොරතුරු විමසීමට ද පුළුවන. රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ ආයතන පිළිබඳ තොරතුරු දැන ගැනීමේ දී පුවත්පත් දැන්වීම්, ඒ ඒ ආයතනවල වෙබ් අඩවි හෝ ප්‍රකාශන, දුරකථන නාමාවලියේ කහ පිටු, ව්‍යාපාර උපදේශකයන් යන ආදි මූලාශ්‍ර භාවිත කළ හැකි ය.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සේවා සපයන ආයතන

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය මූල්‍ය සේවාත් මූල්‍ය නොවන සේවාත් සැපයීම සඳහා ආයතන ගණනාවක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. මූල්‍ය සේවා සැපයෙන්නේ සාමාන්‍යයෙන් බැංකු නමින් හැඳින්වෙන මූල්‍ය ආයතනවලිනි. මේ මූල්‍ය ආයතනවලින් ප්‍රධාන මූල්‍ය ආයතන කිහිපයක් ද ඒ ආයතන මූල්‍ය ආධාර ලබා දීම සඳහා පවත්වා ගෙන යන ණය යෝජනා ක්‍රම කිහිපයක් ද පහත දැක් වේ:

මූල්‍ය ආයතනය	ණය යෝජනා ක්‍රම
මහජන බැංකුව	කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘති (සුමදි) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නංවා ලීමේ මූලික ණය යෝජනා ක්‍රමය (සුවන) ආහාර සහ පෝෂණ ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය සුළු පරිමාණ ව්‍යවසායකයන් හා රැකියා විරහිත තරුණයන් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමේ ණය යෝජනා ක්‍රමය සුරතුර දිරිය හෝ කුඩා ව්‍යාපාර ණය හෝ තුළින් ස්වයං රැකියා වර්ධනය සමෘද්ධි සංවර්ධන ණය වැඩ සටහන (සසණ) සමෘද්ධි ව්‍යවසායකත්ව සංවර්ධන ණය යෝජනා ක්‍රමය (සවන)
ලංකා බැංකුව	ඉහත දැක්වූ සුමදි, සුවන සහ සසණ ණය යෝජනා ක්‍රම කුඩා ව්‍යාපාර සංවර්ධන ණය යෝජනා ක්‍රමය කුඩා තේ වතු සංවර්ධන ණය යෝජනා ක්‍රමය ධීවර ණය යෝජනා ක්‍රමය
සීමාසහිත කොමර්ෂල් බැංකුව	සුමදි හා සුවන නව පරිපූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ගොවි පොළ යන්ත්‍ර සූත්‍ර ණය යෝජනා ක්‍රමය බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති ණය ස්වයං රැකියා ව්‍යාපෘති ණය
ජාතික සංවර්ධන බැංකුව	සුමදි හා සුවන
ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව	අතහිත, ප්‍රමග, සොබා සුරැකුම්

මූල්‍ය ආයතනය	ණය යෝජනා ක්‍රම
හැටන් නැෂනල් බැංකුව	කෘෂි භෝග නිෂ්පාදනය කිරි පට්ටි ගොවි පොළ කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිල දී ගැනීම ගැමි පුබුදු ණය
සෙලාන් බැංකුව	සුවන හා සුමදි
සම්පත් බැංකුව	සුවන හා සුමදි ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ණය
ප්‍රාදේශීය සංවර්ධන බැංකු රජ රට සංවර්ධන බැංකුව රුහුණු සංවර්ධන බැංකුව කඳු රට සංවර්ධන බැංකුව වයඹ සංවර්ධන බැංකුව සබරගමු සංවර්ධන බැංකුව ඌව සංවර්ධන බැංකුව	සුවන හා සුමදි බැංකු පිහිටුවා ඇති ඒ ඒ පළාත සඳහා සැලසුම් කරන ලද විශේෂ ණය යෝජනා ක්‍රම.
SME බැංකුව, ජාතියේ ව්‍යවසායකත්ව බැංකුව	- වී මෝල් ,මැණික් හා ස්වර්ණාභරණ, උසස් තාක්ෂණය, කර්මාන්ත සේවා, වෘත්තීය සේවා, ආහාර හා ආහාර සැකසුම්, ඉදි කිරීම් සේවා, ධීවර හා විසිතුරු මසුන්, අත් යන්ත්‍ර රෙදිපිළි, ආයුර්වේද සේවා සහ නිෂ්පාදන යන ආදි ව්‍යාපාර සඳහා වූ ණය යෝජනා ක්‍රම

කුඩා පරිමාණ ව්‍යාපාරත් මධ්‍ය පරිමාණ ව්‍යාපාරත් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ආයතන ගණනාවක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. මේ ආයතනවලින් ලබා දෙන පහසුකම් උපදේශක, තාක්ෂණික, අලෙවි, යටිතල, පුහුණු යන ආදි වශයෙන් වර්ග කළ හැකි ය. ව්‍යාපාර පිහිටු වීම, මෙහෙයුම් කටයුතු හා ප්‍රවර්ධනය සඳහා ආයෝජන හා කළමනාකරණ සහාය උපදේශක සේවා යටතේ ලබා දෙයි. තාක්ෂණික සහාය යටතේ නිෂ්පාදන සඳහා දැනුම, කුසලතා, තාක්ෂණය, නවීකරණය, පිරිවැය අඩු කිරීම, පරිසර සංරක්ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය යන ආදිය සඳහා සේවා සපයනු ලැබේ. පර්යේෂණ

සහාය යටතේ වෙළෙඳ පොළ, නිෂ්පාදන තාක්ෂණය යන ආදිය සඳහා පර්යේෂණ සහාය ලබා දෙයි.

යටිතල පහසුකම් යටතේ බලශක්තිය, නළ ජලය, ප්‍රවාහන පහසුකම්, සන්නිවේදන පහසුකම්, ඉඩම් සංවර්ධනය යන ආදිය සඳහා සහාය ලබා දෙයි. මූල්‍ය නොවන පහසුකම් සලසන ප්‍රධාන ආයතන කීපයක් ද ඒ ඒ ආයතන සපයන සේවා කීපයක් ද පහත දැක්වේ.

ආයතනය	**සපයන සේවා**
කාර්මික සංවර්ධන මණ්ඩලය	ආයෝජන ඉඩ ප්‍රස්තා පිළිබඳ ව උපදෙස් සැපයීම කාර්මික තොරතුරු සැපයීම තාක්ෂණික සහාය ලබා දීම ඉංජිනේරු සේවා සැපයීම කර්මාන්ත සඳහා වෘත්තීය සේවා සහ මූලික පහසුකම් සැපයීම කළමනාකාරිත්ව දැනුම හා ව්‍යවසායකත්ව සංවර්ධනය අලෙවිකරණ සේවා සැපයීම රබර් භාණ්ඩ සංවර්ධනය
ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය	කර්මාන්ත සඳහා තාක්ෂණික උපදේශකත්වය ලබා දීම විද්‍යාගාර හා කාර්මික උපකරණ ක්‍රමාංකනය කර දීම නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය කිරීම කර්මාන්ත සහ විද්‍යාගාර මිනුම් විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව කාර්මික අමු ද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ පරීක්ෂාව, විශ්ලේෂණය හා තත්ත්ව පාලනය තාක්ෂණික පුහුණුව කර්මාන්තවල තාක්ෂණික දෝෂ නිර්ණය කිරීම

ආයතනය	සපයන සේවා
තරුණ කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය	ව්‍යවසායකත්ව හුරු කරවීමේ වැඩ සටහන් පැවැත් වීම පවත්නා කුඩා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපාරිකයනට සහාය වීම ව්‍යවසායකයන් සඳහා තොරතුරු සේවා සැපයීම
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය	ශ්‍රී ලංකාව තුළ අපනයනයට හිතකර පසුබිමක් ඇති කිරීම
ජාතික ආධුනිකත්ව හා වෘත්තීය පුහුණු අධිකාරිය	කම්හල් තුළ පුහුණු කිරීම් සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම වෘත්තීය පුහුණුව සඳහා වූ මධස්ථාන ආරම්භ කිරීම පුහුණු කිරීමේ ආයතනවල පුහුණු කිරීමේ ඉඩ ප්‍රස්තා වර්ධනය කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම විවිධ ස්තරවල පුහුණු ලාභීන් තීරණය කිරීම
ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය	ජාතික ප්‍රමිති සකස් කිරීම භාණ්ඩ තත්ත්ව සහතික නිකුත් කිරීම තත්ත්ව පද්ධති සහතික කිරීම අපනයන භාණ්ඩවල තත්ත්වය පරීක්ෂා කිරීම ආනයන පරීක්ෂාව පරීක්ෂණාගාර සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා උපදෙස් කාර්මික විද්‍යා ,හා උපකරණ ක්‍රමාංකනය
ජාතික ශිල්ප සභාව	ශ්‍රී ලංකාවේ හා විදේශවල ප්‍රදර්ශන පැවැත් වීම හස්ත කර්මාන්තය, භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රයෝජනයට ගන්නා අමු ද්‍රව්‍යවල හා නිමි භාණ්ඩවල තත්ත්වය වැඩි දියුණු කිරීම

ආයතනය	සපයන සේවා
	හස්ත කර්මාන්ත භාණ්ඩ මෝස්තර නිර්මාණය, නිෂ්පාදනය සහ විකිණීම කරන ශිල්පීන්ට ආධාර සැපයීම ශිල්පීන් පුහුණු කිරීම ශිල්පවලට අදාළ තොරතුරු හා දැනුම පැතිර වීම ශ්‍රී ලංකාවේ පාරම්පරික, ජාතික හෝ සංස්කෘතික වටිනාකමකින් යුත් හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීම පිළිබඳ ව කටයුතු කිරීම
ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)	හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කිරීම සහ ඒ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට උපයෝගි කර ගන්නා අමු ද්‍රව්‍යවල තත්ත්වය වැඩි දියුණු කිරීම හස්ත කර්මාන්ත භාණ්ඩ ප්‍රදර්ශනයට තැබීම හා විකිණීමට කටයුතු කිරීම හස්ත කර්මාන්ත භාණ්ඩ ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල විකිණීමට කටයුතු කිරීම හස්ත කර්මාන්ත ශිල්පීන් පුහුණු කිරීම
ශ්‍රී ලංකා මෝස්තර මධ්‍යස්ථානය	මෝස්තර නිර්මාණාත්මක උපදෙස් හා සේවා සැපයීම නව මෝස්තර නිර්මාණ බිහි කිරීම හා ඒවා ප්‍රදර්ශනය කිරීම මෝස්තර නිර්මාණකරණයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම මොස්තර නිර්මාණකරුවන් පුහුණු කිරීම අලෙවි සහාය ලබා දීම නිර්මාණ දිරිගැන්වීම මොස්තර නිර්මාණකරණයට අවශ්‍ය තොරතුරු සැපයීම

ආයතනය	සපයන සේවා
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	කර්මාන්තකරුවනට බලපාන ඉංජිනේරුමය ගැටලුවලට පිළියම් ලබා දීම කර්මාන්ත සංවර්ධනය සඳහා යෝග්‍ය තාක්ෂණ ක්‍රම සැලසුම් කිරීම විද්‍යුත් විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයේ ගෘහස්ත හා කර්මාන්ත උපකරණ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම අඩු වියදම් ගොඩනැගිලි ඉදි කිරීම, සේවා පුහුණු පාඨමාලා හා වැඩ මුළු මඟින් නව තාක්ෂණය පැවරීම
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම අපේක්ෂා කරන්නනට ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම වෘත්තීය පුහුණුලාභීන් සඳහා පුහුණු පාඨමාලා තුළින් ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම ණය පහසුකම් ලබා ගැනීම සඳහා බැංකු සම්බන්ධීකරණය පසු විපරම් සේවා සැපයීම

උපකාර ලබා ගැනීම පිණිස හමු විය යුතු පුද්ගලයන් සපුරාලිය යුතු මූලික අවශ්‍යතා හා ලිපි ලේඛන කටයුතු

ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මූල්‍ය හෝ මූල්‍ය නොවන හෝ උපකාර දෙන ආයතන පිළිබඳ දැන ගැනීමෙන් පසු ව්‍යාපාරිකයනට අවශ්‍ය සේවා සපයා ගැනීමේ දී එකී ආයතනවල හමු විය යුතු පුද්ගලයන් ද අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි ද සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

මූල්‍ය සේවා සැපයීම කෙරෙහි අවධානය ප්‍රථමයෙන් යොමු කරමු. මෙහි දී ව්‍යාපාරිකයනට එකී මූල්‍ය ආධාර සපයන බැංකුවේ කළමනාකරු හෝ ණය නිලධාරි හෝ හමු වීමට සිදු

වේ. ඒ හැර මූල්‍ය ආධාර ලබා ගැනීමේ දී සාමාන්‍යයෙන් සපුරා ලීමට සිදු වන මූලික අවශ්‍යතා කීපයක් ද පවතී. එකී මූලික අවශ්‍යතා සඳහා නිදසුන් කීපයක් පහත දැක්වේ:

බැංකු ගිණුමක් ආරම්භ කිරීම
ණය අයදුම් පත්‍රයක් සම්පූර්ණ කර භාර දීම
සුරැකුම් වශයෙන් නිශ්චල හෝ චංචල හෝ දේපොළ අවශ්‍ය වේ නම් එකී දේපොළවල නිරවුල් අයිතිය තහවුරු කැරෙන ලේඛන සූදානම් කර ගැනීම
පුද්ගල සුරැකුම් ඉදිරිපත් කරන්නේ නම් ඒ පුද්ගලයන්ගේ වැටුප් වාර්තා හෝ ආදායම් වාර්තා හෝ සූදානම් කර ගැනීම නැත හොත් පවුලේ සාමාජිකයකු ඒ සඳහා ඉදිරිපත් වන්නේ නම් ඒ බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛන
ව්‍යාපාර සැලැස්ම / ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කිරීම
යන්ත්‍රසූත්‍ර පිළිබඳ වූ තාක්ෂණික ඇගැයීම් වාර්තා
ව්‍යාපාර ලියා පදිංචිය පිළිබඳ ලේඛන
මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත් අනුමත කිරීම් ඇතුළත් ලේඛන
ව්‍යාපාර සඳහා වූ විශේෂ බලපත්‍ර අවශ්‍ය වේ නම් ඒ ලේඛන.

මූල්‍ය නොවන සේවා ලබා ගැනීමේ දී අදාළ ආයතනයෙන් තොරතුරු පළමුවෙන් විමසීම වැදගත් වේ. එහි දී දුරකථන, ලිපි ආදි මාධ්‍ය භාවිතා කළ හැකි ය. මූල්‍ය නොවන සේවා ලබා ගැනීමේ දී ද එකී සේවා සපයන ආයතනවල යම් යම් පුද්ගලයන් මුණ ගැසීමට බොහෝ විට සිදු වේ. මෙහි දී ඒ එක් එක් ආයතනයේ ප්‍රධානියා හෝ තොරතුරු නිලධාරි, ව්‍යාපාර උපදේශක, සංවර්ධන නිලධාරි යන තනතුරු දරන පහසුකම් සපයන්නකු හෝ මුණ ගැසීමට සිදු විය හැකි ය. මූල්‍ය නොවන සේවා ලබා ගැනීමේ දී විශේෂයෙන් සපුරා ලිය යුතු අමතර අවශ්‍යතා නො තිබිය හැකි ය.



සාරාංශය

ව්‍යවසායයකයන් ආරම්භ කරන ව්‍යාපාර සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා විවිධ උපකාර වැඩ සටහන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. ව්‍යාපාරිකයනට අවශ්‍ය උපකාර මූල්‍ය උපකාරත් , මූල්‍ය නොවන උපකාරත් වශයෙන් වර්ග කර දැක්විය හැකි ය. ව්‍යාපාරිකයන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ලබා දෙන මූල්‍ය ආධාර මූල්‍ය උපකාරවලට ඇතුළත් වේ. ව්‍යාපාරිකයනට ලබා දෙන තාක්ෂණික, අලෙවි, උපදේශාත්මක, යටිතල යන ආදි පහසුකම් මූල්‍ය නොවන උපකාරවලට ඇතුළත් වේ. ව්‍යාපාර දිරිමත් කිරිම සඳහා ලබා දෙන මූල්‍ය හෝ මූල්‍ය නොවන හෝ උපකාරවලින් නිසි ඵල ප්‍රයෝජන ලබා ගතහොත් ව්‍යාපාර කටයුතු සාර්ථක ව කර ගෙන යා හැකි ය.

ක්‍රියාකාරකම 3

ඔබ අනාගතයේ දී කුඩා පරිමාණයෙන් ආරම්භ කිරීමට අපේක්ෂා කරන ව්‍යාපාරයක් හඳුනා ගන්න.

(1) ඒ ව්‍යාපාරය නම් කරන්න.

(2) ව්‍යාපාර කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරයක් සපයන්න.

(3) ඒ ව්‍යාපාරය හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරන්න.
ආරම්භ කිරීමට පෙර සපුරා ලිය යුතු අවශ්‍යතා
ආරම්භ කිරිම සඳහා ඔබට අවශ්‍ය සහාය

(4) ඔබට අවශ්‍ය සහාය ලබා ගැනීම සඳහා ඔබ තෝරා ගන්නා ආයතන මොනවා ද?

(5) ඒ ආයතනවල සේවා ලබා ගැනීම සඳහා හමු වීමට සිදුවිය හැකි පුද්ගලයෝ කවරහු ද?

(6) ඔබගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඔබ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ විස්තර කරන්න?